# සමාජ විද්‍යාව

# SSG I - සමාජ විද්‍යා න්‍යාය හා ක්‍රමවේදය

Prof. Mallika Pinnawala

BA (Hons.-Sociology) MA (By Reserch-Sociology- PDN), Ph.D (Sociology- The Netherlands)

Professor,Dept. of Sociology/ Director , Centre for Distance & Continuing Education (CDCE)

University of Peradeniya, Peradeniya.

e-mail mallikap@pdn.ac.lk

# හැඳින්වීම

මෙම විෂය නිර්දේශය මගින් බලාපොරොත්තු වන්නේ සාමාන්‍ය උපාධිය සඳහා සමාජ විද්‍යාව විෂයක් ලෙස හදාරන සිසු සිසුවියන්ට අවශ්‍යය මූලික න්‍යායාත්මක දැනුම හා සමාජ පර්යේෂණ සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳව අවබෝධයක් ලබා දීමටයි. න්‍යායන් පිළිබඳ නියමාකාරයෙන් දැනුමක් නොමැතිකම හා සමාජ පර්යේෂණ සඳහා අවශ්‍ය ශිල්පීය දක්ෂතාවයකින් තොරව සැබෑ සමාජ විද්‍යාඥයෙකු ලෙස සමාජයට පිවිසිය නොහැක. ඒ අනුව සමාජ විද්‍යාවේ වැදගත්ම පාඨමාලාවක් ලෙස සමාජ විද්‍යාව I (SSG I) එනම් සමාජ විද්‍යාවේ න්‍යාය හා ක්‍රමවේදය සැලකිය හැක.සමාජයේ යථාර්ථය සොයා බලනු ලබන මෙම පාඨමාලාව තුලින් ප්‍රධාන කරුණු කිහිපයක් අවධාරණය කෙරේ.

ඉන් පළමුවැන්න වනුයේ සමාජ විද්‍යාවේ දියුණුවට බලපෑ අදටත් නොවෙනස්ව සමාජ විද්‍යාවේ භාවිතා වන න්‍යායන් වල ඓතිහාසික වර්ධනයත් එයට බලපෑ සමාජ පසුබිමත් සොයා බැලීමයි. එහිදී ඒවායේ අන්තර්ගතයන් මෙන් ම අන්තර් සබඳතාද සලකා බැලේ. ඒ අනුව මෙහිදී සමාජ විද්‍යාවේ මූලික න්‍යායන් කොටස් දෙකකට එනම් පැරණි (සම්භාව්‍යය න්‍යායන්) හා නූතන න්‍යායන් ලෙස සාකච්ඡා කෙරේ.

දෙවැන්න ලෙස සමාජ විද්‍යාත්මක පර්යේෂණ සඳහා භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රම පිළිබඳ මූලික අවබෝධයක් දීමට උත්සාහ කෙරේ. එහිදී සමාජ විද්‍යා පර්යේෂණ වර්ගයන්, එදා සහ අද ලෙස පර්යේෂණ වල පවත්නා වෙනස් කම්, පර්යේෂණ සැලසුම්, දත්ත එකතු කිරීම හා විග්‍රහ කිරීම ආදී ලෙස ක්‍රමවේදයන් සරල ලෙසින් සාකච්ඡා වේ. එහිදී මූලික සංඛ්‍යාන විද්‍යාත්මක ගණනයන්ට විශේෂ අවධානය යොමු වෙන හෙයින් ඒ පිළිබඳ මූලික අවබෝධයක් තිබීම සිසු සිසුවියන්ට එය හැදෑරීම පහසු කරනු ඇත.

තෙවැන්නේ දි න්‍යායන් හා ක්‍රමවේදය එකට භාවිතා කර සමාජ විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයෙන් සමාජය දෙස බැලීමට හා එය තේරුම් ගැනීමට සිසු සිසුවියන්ට හැකිවනු ඇත. ඒ අනුව ඔබ සමාජ විද්‍යාත්මක න්‍යාය හා ක්‍රමවේද පිළිබඳ දැනුම ලබාගත යුතුම අතර එය උපයෝගී කර ගෙන සමාජ විග්‍රහයේ යෙදීමට හැකියාව ද ඇති කර ගත යුතුය.

ඒ අනුව මෙම පාඨමාලාව කොටස් දෙකකින් යුක්ත වන අතර පළමු කොටස තුළ න්‍යායාත්මක කරණුත්, දෙවැන්න තුළ ක්‍රමවේදිය හා ශිල්පීය ක්‍රම වලට අදාල කරුණුත් අඩංගු වේ. මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාව තුළ මෙහි පළමු කොටස පිළබඳ එනම් න්‍යායාත්මක කරුණු පිළිබඳ සාකච්ඡා වේ. මෙහි ප්‍රධාන අරමුණ දැනුම ගොඩනැගීම හා සමාජ සන්දර්භය අතර ඇති පුළුල් සම්බන්ධතාවය පිළිබඳ අදහස් සිසු සිසුවියන්ට ලබා දීමයි. දැනුම ගොඩනැගෙන්නේ සමාජ දේශපාලන ක්‍රියාවලිය ආශ්‍රයෙනි. ඒ අනුව සෘජුවම ප්‍රකාශ නොවුණද දැනුම අතර සමාජය හා දේශපාලන ක්‍රියාවලිය අතර යම්කිසි සබඳතාවයක් ඇති බව මෙහිදී අවධාරණය කෙරේ.

## සමාජ විද්‍යාව

## SSG I - පළමුවැනි කොටස (සමාජ විද්‍යා න්‍යායන්)

# හැඳින්වීම

සාමාන්‍ය උපාධිය සඳහා සමාජ විද්‍යාව විෂයක් ලෙස හදාරන සිසු සිසුවියන්ට අවශ්‍යය මූලික න්‍යායාත්මක දැනුම හා සමාජ පරයේෂණ සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳව අවබෝධයක් ලබා දීම මෙම විෂය නිරදේශය මගින් බලාපොරොත්තු වේග න්‍යායන් පිළිබඳ නියමාකාරයෙන් දැනුමක් නොමැතිකම හා සමාජ පරයේෂණ සඳහා අවශ්‍ය ශිල්පීය දක්ෂතාවයකින් තොරව සැබෑ සමාජ විද්‍යාඥයෙකු ලෙස සමාජයට පිවිසිය නොහැකී ඒ අනුව සමාජ විද්‍යාවේ වැදගත්ම පාඨමාලාවක් ලෙස සමාජ විද්‍යාව I (SSG I) එනම් සමාජ විද්‍යාවේ න්‍යාය හා ක්‍රමවේදය සැලකිය හැකිසමාජයේ යථාවථය සොයා බලනු ලබන මෙම පාඨමාලාව තුළින් ප්‍රධාන කරුණු කිහිපයක් අවධාරණය කෙවේ ඒ අනුව මෙම පාඨමාලාව කොටස් දෙකකින් යුක්ත වන අතර පළමු කොටස තුළ න්‍යායාත්මක කරණුත් දෙවැන්න තුළ ක්‍රමවේදීය හා ශිල්පීය ක්‍රම වලට අදාළ කරුණුත් අඩංගු වේ මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාව තුළ මෙහි පළමු කොටස පිළබඳ එනම් න්‍යායාත්මක කරුණු පිළිබඳ සාකච්ඡා වේ සමාජ විද්‍යාවේ දියුණුවට බලපෑ අදටත් නොවෙනස්ව සමාජ විද්‍යාවේ භාවිතා වන න්‍යායන් වල ඓතිහාසික වංධනයත් එයට බලපෑ සමාජ පසුබිමත් සොයා බැලීමයී එහිදී ඒවායේ අන්තරගතයන් මෙන් ම අන්තර සබඳතාද සලකා බැලේ ඒ අනුව මෙහිදී සමාජ විද්‍යාවේ මූලික න්‍යායන් කොටස් දෙකකට එනම් පැරණි (සම්භාව්‍යය න්‍යායන්) හා නූතන න්‍යායන් ලෙස සාකච්ඡා කෙවෙ**මෙහි ප්‍රධාන අරමුණ** දැනුම ගොඩ'නැගිම හා සමාජ සන්දරභය අතර ඇති පුළුල් සම්බන්ධතාවය පිළිබඳ අදහස් සිසු සිසුවියන්ට ලබා දීමයි දැනුම ගොඩ'නැගෙ'න්නේ සමාජ දේශපාලන ක්‍රියාවලිය ආශ්‍රයෙනී ඒ අනුව සෘජුවම ප්‍රකාශ නොවුණද දැනුම අතර සමාජය හා දේශපාලන ක්‍රියාවලිය අතර යම්කිසි සබඳතාවයක් ඇති බව මෙහිදී අවධාරණය කෙරේ

---

**පිළිතුරු ලිවීමේ දුර්වලතා**

- ප්‍රශ්නය තේරුම් නොගැනීම
- පිළිතුර සංස්කරණය කර නොගැනීම
- අපැහැදිලි අකුරු
- භාවාත්මක හැඟීම්
- සමාජ විද්‍යාවේ පාරිභාෂිත වචන පාවිච්චි නොකිරීම

## සමාජ විද්‍යාත්මක න්‍යාය යනු කුමක්ද?

න්‍යාය යනු "යමක් පැහැදිලි කිරීමේදී උපයෝගී කරගනු ලබන අදහස් සමූහයක එකතුවකි". ඒ අනුව සමාජ විද්‍යාත්මක න්‍යාය යනු "මානව සමාජය විග්‍රහ කිරීමට උපයෝගී කරගන්නා වූ අදහස් සමූහයන්ගේ එකතුවයි". එසේම න්‍යාය අපගේ රුචි අරුචි තත්ත්වයන්, අගයන් හා දිශානතීන්, බිඳවැටීම් හෝ ජයග්‍රහණයන්. අපගේ විවිධ උපාය මාර්ගයන් මිනිසාගේ මරණින් පසු ජීවිතය, ආදි විවිධ වූ දේවල් සම්බන්ධයෙන් පටු හා පුළුල් වූ ආකෘතියක් ගොඩනැගෙන බුද්ධිමය ප්‍රකාශනයකි. ඒ අනුව න්‍යාය යනු අප සමාජය දෙස බලන ආකාරයයි. එමනිසා වර්තමාන සමාජය තුළ සදාතනික වූ න්‍යාය ධර්මයක් හඳුනාගත හැකි නොවේ.

## සමාජ විද්‍යා විෂයය බිහිවීමට පසුබිම් වූ සමාජ හා ඓතිහාසික පසුබිම

සමාජ විද්‍යාව විෂයයක් ලෙස ආරම්භ වූයේ 19 වන සියවසේ දී මිනිස් හැසිරීම අධ්‍යයන කිරීම සුදුසු විනය ක්‍රමයකත් ලෙසිනි. එය ක්‍රමානුකූල විෂයයක් බවට පත් වූයේ 19 වන සියවසේ අගභාගයේ හා 20 වන සියවසේ මුලදී බවත් සමාජ විද්‍යාත්මක චින්තනය ආරම්භ වූයේ ඉතා ඈත අතීතයේ දී බවත් කිව හැකිය.

## සමාජ විද්‍යා විෂයය ආරම්භයට බලපෑ ඓතිහාසික සංසිද්ධි

මුල්ම ඓතිහාසික සාධකය වනුයේ එංගලන්තය කේන්ද්‍ර කරගෙන ඇති වූ ආගමික පුනරුදයයි. මාටින් ලූතර් හා ජෝන් කැල්වින් නම් පූජකවරු ගෙනගිය කතෝලික ආගමට එරෙහි වූ මතවාදී අරගලය (පල්ලියට විරුද්ධව චෝදනා 300ක් එහි අඩංගු විය)මෙහිදී ප්‍රධාන වේ. ඒ තුළින් නව ආගමික දර්ශනයක් හා ජීවන රටාවන් යුරෝපයට හඳුන්වා දීම සිදු විය.

මෙම වෙනස අදියරයන් කිහිපයක් යටතේ පෙන්විය හැකිය.

I අදියර - රෙපරමාදු කිස්ත්‍රියානි ආගම හා ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හඳුන්වාදීම.

- ආගමික කරුණු වලට පමණක් සීමා නොවීම
- පුද්ගලයාගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම
- අලව්කික දේවවාද බැහැරවීම
- ඉපයීම හා ආයෝජනය තුළින්
- ධනවාදී ආර්ථික ක්‍රම බටහිර රටවල වර්ධනය වීම
- මිනිසුන් අන්ධානුකරණ වෙනුවට අළුත් දේ ගවේෂණය කිරීම
- මෙහි ප්‍රතිඵලයන් ලෙස කාර්මික විප්ලවය ඇතිවීම
- මිනිසුන් සුඛවිහරණය සොයා යෑම
- වැටුප් ලබන කම්කරු පන්තියක් බිහිවීම/ යන්ත්‍ර සූත්‍ර බිහිවීම/ ප්‍රාගුණ්‍ය පිරිස බිහිවීම
- ලාභ, ඉපයීම් හා අයෝජන ඇතිවීම

II අදියර - සමාජය වෙනස්වීම
- ගමෙන් නගරයට රැකියා සොයා සංක්‍රමණය වීම
- නාගරිකරණය
- සාම්ප්‍රදායික පවුල් ක්‍රමය වෙනස් වීම

- ආගමික විශ්වාස සාරධර්ම වෙනස් වීම
- මේවාට විසඳුම් ලෙස සමාජ පිබිදීම

III අදියර - දේශපාලන පිබිදීම

යටත්විජිතවාදයේ ව්‍යාප්තිය

- වතු වගාව
- පාලනය සූක්ෂම කිරීමට යටත්විජිතවල ජන ජීවිතය අධ්‍යයන කිරීම
- නව අධ්‍යාපන අවශ්‍යතා උදෙසාසමාජ මානව විද්‍යාව බිහිවීම

ඇමෙරිකානු විප්ලවය

- ඇමෙරිකානුවන් තම මව් රටට විරුද්ධව ඇති කරනු ලැබූ විප්ලවය
- යටත් විජිත වාදයටත්, අධිරාජ්‍යවාදයටත් විරුද්ධව මෙය සිදුවිය. (මානව අයිතිවාසිකම් වෙනුවෙන්)

ප්‍රංශ ආණ්ඩු විප්ලවය

- සාම්ප්‍රදායික වැඩවසම් ක්‍රමය - පල්ලිය සම්ප්‍රදායික ධර්මතාවලට එරෙහිව නැගුණු විප්ලවයන්
- ජාතිකත්වය හා ලිබරල්වාදය මුල්වීම

## දේශපාලන පිබිදීම හා සමාජ විද්‍යාවේ ආරම්භය

(1) කාර්මිකරණය ලක් වූ ධනවාදී සමාජ රටාව තේරුම් ගැනීමට සමාජ විද්‍යාඥයින් බිහිවීම

(2) ධනේශ්වර වාදී ලක්ෂණ සමාජයට පැමිණීමත් සමග උද්ගත වූ අර්බුද ත්ත්වය විග්‍රහයට හා තේරුම් ගැනීම නව විෂයක් ලෙස සමාජ විද්‍යාව බිහිවීම

සෙන්ට් සිමෝන් : සමාජය පිළිබඳ වෙනම විද්‍යාවක අවශ්‍යතාවය පෙන්වීම

ඔගස්ටේ කොම්ටේ : පරිණාම වාදී දෘෂ්ඨි කෝණයකින් සමාජය දෙස බැලීම ඔහු සංකල්ප දෙකක්. එනම් සමාජ ස්ථිතිකත්වය හා සමාජ ගතිකත්වය තුළින් සමාජය විග්‍රහ කිරීම සිදු කළේය.

## සමාජ විද්‍යාවේ වර්ධනය

වර්ධනයට දායක වූ සමාජ විද්‍යාඥයින්

(1) සමාජ විද්‍යාවේ මූලික ගැටළු විග්‍රහ කරමින් ඒ පිළිබඳ අවධානය යොමු කළ සමාජ විද්‍යාඥයින්
   - සෑම සමාජ ගැටළුවක ඓතිහාසික ක්‍රියාවලික් පදනම් වී ඇත. (එමානුවෙල් කාන්ට්, හේගල්, කාල් මාක්ස්)

(2) ජීව විද්‍යාත්මක අදහස් ඔස්සේ සමාජ හැසිරීම් විග්‍රහ කිරීම

- පෞරුෂය හැඩ ගැසීමට ආරයේ බලපෑම
  චාල්ස් ඩාවින්ගේ පරිණාම වාදය තුලින් හර්බට් ස්පෙන්සර් සහ ඔගස්ටේ කොම්ටේ මේ අදහස දක්වා ඇත.

(3) ක්‍රමවේදය පර්යේෂණ ඔස්සේ සමාජය විග්‍රහ කල සමාජ විද්‍යාඥයින්
- සෝවින්ස්, කාල් පියර්සන්.

සමාජ විද්‍යා වර්ධනයට උපයෝගී වූ ප්‍රධාන ගුරුකුල
(1) මානව පරිසරවාදි හා ජන විකාශනවාදි අදහස් සමග සමාජය විග්‍රහ කල ගුරු කුලය
(2) සමාජයේ සාමාන්‍ය රටාව මත සමාජ ක්‍රියාව තේරුම් ගැනීමට ප්‍රයත්න දැරූ ගුරු කුලය
(3) ඓතිහාසික අර්ථකථන තුලින් සමාජය විග්‍රහ කල ගුරු කුලය

කාර්මික විප්ලවය ⟶ කාර්මීකරණය ⟶ නාගරීකරණය
මේ තුලින් සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න රැසක් බිහිවීම ⟶ සමාජය වෙනස් වීම
මෙය විග්‍රහය කිරීමට අනුභාවික විධි ක්‍රමයක් ලෙස සමාජ විද්‍යාව වර්ධනය වීම

මේ සඳහා දායකත්වය දැක්වූවන්:-
එමිල් දූර්කයිම්
- ප්‍රංශය තුල සමාජ විද්‍යාව පිලබඳ ගුරු කුලය බිහිවීම

මැක්ස් වේබර්
- ජර්මනය තුල සමාජ විද්‍යා කුලය බිහිවීම

සමකාලීන සමාජ ප්‍රශ්න සමාජ විද්‍යාත්මක විග්‍රහ කිරීම තුලින් වූ වර්ධනය

| | | | |
|---|---|---|---|
| (1) | එමිල් දූර්කයිම් | - | අනෝමිය සියදිවි නසා ගැනීම පිලිබඳ අධ්‍යයනය |
| (2) | මැක්ස් වේබර් | - | ධනවාදය නැගීම හා ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම පිලිබඳ අධ්‍යයනය |
| (3) | චාල්ස් කූලි | - | කුඩා සමූහ පිලබඳ අධ්‍යයනය |

## සම්භාව්‍ය සමාජ විද්‍යාත්මක චින්තනය

සම්භාව්‍ය සමාජ විද්‍යා ක්‍රමයට අයත් කාලය 20 වන සියවසේ මුල් භාගයේ (සමාජ විද්‍යාවේ ආරම්භය) සිට 20 වන සියවසේ මැද භාගය දක්වා වේ.

සම්භාව්‍ය සමාජ විද්‍යා විග්‍රහයන්ගේ විශේෂ ලක්ෂණ

දැඩි ලෙස සාම්ප්‍රදායික විද්‍යාත්මක ක්‍රමය මත පදනම්ව සිටීම හා සමාජ විද්‍යාව ස්වාභාවික විද්‍යාවක් ලෙස සැලකීම
උදා :- ඔගස්ටේ කොම්ටේ සමාජ විද්‍යාව මුලින්ම හැඳින්වූයේ - Positive Philosophy නමිනි (යථානුභූත වාදී දර්ශනයක්)

සම්භාව්‍ය සමාජ විද්‍යා චින්තනයේ ආකෘති

(1) සමාජය පිලිබඳ පරිණාමවාදි ආකෘතිය
(2) සමාජය පිලිබඳ ඓන්ද්‍රියවාදි ආකෘතිය

සමාජ විද්‍යාව බිහි වූ මුල්ම යුගයේ දී මෙම ආකෘති වැදගත්විය. සමාජ විද්‍යාවේ පියා ලෙස සැලකෙන ප්‍රංශ ජාතික සමාජ චින්තකයකු වූ ඔස්ටේ කොම්ට් (August Comte 1830 - 1898) සමාජය තේරුම් ගැනීම සඳහා වෙන විෂයක අවශ්‍යතාවය පිළබඳ අදහස් ඉදිරිපත් කිරීමෙන් පසුව විවිධ න්‍යායාත්මක සහ විග්‍රහාත්මක සාම්ප්‍රදායන් ඉදිරියට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ආකෘති දෙක බිහිවිය. ඒවායේ බලපෑම අදත් දක්නට ලැබේ.

උදා:- පසුකාලීන කෘත්‍යවාදය බිහිවීමට හා පද්ධති න්‍යාය සමාජ විද්‍යාවට ඇදීමේදී ජෛන්ද්‍රියවාදී ආකෘතිය බලපෑම.

සමාජය පිළබඳ පරිණාමවාදී අදහස්

පරිණාමය වෙමින් සමාජය ඉදිරියට ගමන් කර බව හා එය සරල තත්ත්වයක සිට සංකීර්ණ තත්ත්වයකට ගමන් කරන අවදින් ගෙන් යුතු බව මෙහි ප්‍රධාන අදහසයි. මෙම අදහසේ ඍජුවම බැඳී සිටි සමාජ විද්‍යාඥයකු වන්නේ ඉංග්‍රීසි ජාතික හර්බට් ස්පෙන්සර්ය (Herbert Spencer) පුළුල්ව බැලූ විට සම්භාව්‍ය සාම්ප්‍රදායික තුළ සිටි සියලුම චින්තකයින් පාහේ මෙම මත වාදයට සම්මාදම් කර තිබීම හෝ ආභාෂය ලබා ගැනීම දැකිය හැකිය. පරිණාමය පිළිබඳ සාකච්ඡා කිරීමේදී වැදගත්ම වනුයේ "සමාජ පරිණාමය" වේය යන අදහස පැමිණියේ සත්ත්ව පරිණාමය පිළබඳ මතවාද සමග නොවන බවයි. ඒ අනුව සමාජ පරිණාමය යන අදහසට වඩා පැරණි බව කිව හැකිය.

සමාජය පිළිබඳ ජෛන්ද්‍රියවාදී අදහස්

ජෛන්ද්‍රියවාදී අදහස් සමාජය පිළිබඳ පරිණාමවාදී එළඹුම සමග සමීපව සම්බන්ධ වේ. මෙහිදී සමාජය ජෛන්ද්‍රියකට සමාන බව සැලකේ. මේ කරුණ නිසා පරිණාමවාදී තර්කය සම්භාව්‍ය සමාජ විද්‍යාවේ එන කෘත්‍යවාදය සමග සම්බන්ධ වේ. එසේ වන්නේ කෘත්‍යවාදය සමාජයේ ජෛන්ද්‍රිය සමානත්වය පිළිගන්නා බැවිනි.

## නූතන සමාජ විද්‍යාත්මක න්‍යායන්

කෘත්‍යවාදය (Functionalism)

කෘත්‍යවාදය සමාජ විද්‍යා න්‍යායක් මෙන් ම ක්‍රම වේදයක් ද වේ. කෘත්‍ය වාදයේ ඓතිහාසික පසුබිමේ දී ස්වාභාවික විද්‍යාවන් වැදගත් වී ඇත. එනිසා මානව විද්‍යාවට හා සමාජ විද්‍යාව යන දෙකටම වැදගත් වේ.

මානව විද්‍යාවේ ප්‍රධාන කෘත්‍යවාදීන්

- (1) බ්‍රොන්ස්ලෝ මැලිනවොස්කි (B. Malinouske)
- (2) රැඩ්ක්ලිප් බ්‍රවුන්ස් (R. Brown)
- (3) එවන්ස් ප්‍රිචාර්ඩ් (E. Pritchard)

මැලිනවොස්කිගේ කෘත්‍යවාදය:- පුද්ගලවාදී කෘත්‍යවාදයයි (Individualist Functionalism)

බ්‍රවුන්ගේ කෘත්‍යවාදය :- පුද්ගලවාදී කෘත්‍යවාදය ප්‍රතික්ෂේප කරයි. සමාජ සබඳතා කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. බ්‍රවුන් තම විග්‍රහය තුළින් සමාජය පිළිබඳ ප්‍රධානතම ගැටළු 3 අවබෝධ කර ගැනීමට උත්සාහ දරා තිබේ.

1. සමාජ නිර්මාණ වර්ග කියක් තිබේ ද?
2. සමාජ නිර්මාණ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?
3. නව සමාජ නිර්මාණ ඇති වන්නේ කෙසේ ද?

ප්‍රිවාඩ්ගේ කෘතවාදය :- ප්‍රධාන අවධානය සමාජයක ස්ථාවරත්වය හා අනුකලනය කෙරෙහිය (Stability & Integration)

සමාජ විද්‍යාවේ කෘත්‍යවාදීන් :-

| | |
|---|---|
| ඔගස්ට් කොම්ට් | (1798 - 1857) |
| හර්බට් ස්පෙන්සර් | (1820 - 1903) |
| විල්ෆ්‍රෙඩෝ පරේටෝ | (1840 - 1923) |
| එමිල් ඩර්කයිම් | (1858 - 1917) |
| මැල්කොටේ පාර්සන් | (1902 - 1979) සහ |
| රොබට් කේ. මර්ටන් | (පාසන්ගේ අනුගාමිකයෙකි) |

ස්පෙන්සර් ඓන්ද්‍රිය සාදෘශ්‍යය පිළිබඳ විග්‍රහය පදනම් සමාජය විග්‍රහ කිරීමට උත්සාහ දරනු ලැබේ. ඔහු ජීව වස්තු හා සමාජීය ජීව වස්තු (Biological Organism , Social Organism) යන ප්‍රධාන විචල්‍යයන් දෙකක් ඔස්සේ සමාජය විග්‍රහ කිරීමට උත්සාහ දරා ඇත.

පරේටෝ තම කෘත්‍යවාදි විග්‍රහයන් ගොඩනගනු ලැබුවේ සමාජය සමතුලිතතාව මත ගොඩනැගෙන් වූ පද්ධතියක් වශයෙන් ය.

දුර්කයිම් :- එතෙක් පැති සියලුම මත ප්‍රතික්ෂේප කර කෘත්‍යවාදයට නව මුහුණුවරක් දී ඇත. පුද්ගලයන්ට සමාජ කරුණු බලපෑම් කරනු ලබන ආකාරය පෙන්වා දී ඇත. ඩර්කයින් හේතු ඵල විග්‍රහය තුළින් තාර්කික කෘත්‍යවාදි ගෙඩනගා ඇත.

පාර්සන් :- පාර්සන්ගේ කෘත්‍යවාදය වැදගත් වූයේ 1950 - 60 අතර කාලය තුළය. සමාජය පිළිබඳ ආකෘතියක් ගොඩනැගාගෙන එහි ක්‍රියාකාරීත්වය තුළින් සමාජය අවබෝධ කරගෙන ඇත.

මේරියන් ලෙවි : (Marion Levy) : කෘත්‍ය කොටස දෙකකට බෙදා ඇත.

1). සුකෘත්‍යය (Eufunction)
2). දුජ්කෘත්‍යය (Disfunctions)

රොබට් කේ. මර්ටන් (Robert K. Merton) ගේ කෘත්‍ය වර්ගීකරණය

1). ප්‍රකට කෘත්‍යය (Manifest Function)
2). නිලීන කෘත්‍යය (Latent Function)

කෘත්‍යවාදය විශ්ලේෂණය : එකම චින්තන ධාරාවක් ඔස්සේ වර්ධනය වී නොතිබීම.
උදා:- මැලිනවොස්කි පුද්ගලවාදි කෘත්‍යවාදයක් ද, ඩර්කයිට් සමාජගත කෘත්‍යවාදය හා බ්‍රවුන් ව්‍යුහාත්මක කෘත්‍යවාදයක් ද පෙන්වා දී ඇත. පාර්සන් මේ සියල්ල එක්කර සමාජ පද්ධතියක් ලෙස නිර්මාණය වන බව පවසයි.

කෘත්‍යවාදයේ වැදගත්කම :-

1. න්‍යායක්, ක්‍රමයක් හා පර්යා ලෝකයක් ලෙස
2. සාර්ව විශ්ලේෂණ ක්‍රම සසුදු විශ්ලේෂණ ක්‍රම බවට පත්කල හැකි වීම.

කෘත්‍ය වාදයට විවේචන :-

1. සාධ්‍යශ්‍යතා වාදාත්මක විශ්ලේෂණයක් වීම (ඵලය සිට හේතුවට යාම) (Teleological Analysis)
2. න්‍යායක් ලෙස අනුමාන සහගත තත්ත්වයක් තිබීම
3. කෘත්‍යය, ඒකමතිකබාවය හා අනුකූලනය යන යෙදුම්වල ඇති අයහපත් බව
4. අතිශෝක්තියෙන් යුක්ත වීම
5. සමාජයක ඇති ගැටුම් හා ව්‍යුහාත්මක පීඩන අමතක කර තිබීම
6. කෘත්‍යවාදය තුළින් සමාජය වෙනස් වීම පැහැදිලි කිරීමට අසමත් වී තිබීම.

සංඝට්ටන න්‍යාය : **(Conflict Theory)**

සංඝට්ටන න්‍යාය සමාජ විද්‍යාවේ ප්‍රධාන න්‍යායක් බවට පත් වූයේ අසූව දශකයෙන් පසුවයි.ඝට්ටනය පිළිබඳ සංකල්පය දේශපාලන දර්ශන වාදය හා සම්භාව්‍ය ආර්ථික විද්‍යාව ඔස්සේ වර්ධනය වූවකි. කෙසේ නමුත් ගැටුම පිළිබඳ අදහස සමාජ විද්‍යාඥයින්ට විග්‍රහයේ කේන්ද්‍රීය සංකල්පයක් බවට පත්ව මාර්ක්ස්වාදයේ බලපෑම සමගය.

මාක්ස්වාදී විග්‍රහයන්ට අනුව සමාජයට පදනම සපයන්නේ නිෂ්පාදන ක්‍රමයයි. ඔවුන්ට අනුව නිෂ්පාදන සම්බන්ධතාවයන් පංති ප්‍රතිවිරුද්ධබාවය අනුව තිරණය වේ. පංති විරුද්ධතාවය ගැටුමට පදනම සපයන අතර සමාජයේ ප්‍රධාන ගතිකය වන්නේ පංති විරුද්ධතාවයයි. සමාජ ඉතිහාසයන් පංති ගැටුමේ ඉතිහාසය යැයි මාක්ස් පවසන්නේ ඒ නිසාය.මාක්ස් භෞතිකවාදී (Materialism) ඔස්සේ කළ මෙම සමාජ විග්‍රහය ඝට්ටන න්‍යාය ශක්තිමත් වීමට හේතුවකි.
කොහොම නමුත් මාක්ස්ගෙන් සිදුවූයේ එතෙක් පැවැති ඝට්ඨනය පිළිබඳ සංකල්පය හා න්‍යායන් සමාජය විග්‍රහ කිරීමට අවශ්‍යය න්‍යායාත්මක පදනමක් වශයෙන් ගොඩනැගීමය. එය මාක්ස්වාදය (Marxism) වේ.මාක්ස්ගෙන් පසුව නව මාක්ස්වාදීන් (Neo-Marxist) නූතන ධනේෂ්වරවාදීන් විග්‍රහ කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ විද්‍යාවේ ඝට්ඨන න්‍යාය ගොඩ නැගිණි.

නව මාක්ස්වාදීන් (නූතන සමාජ විද්‍යාවේ ඝට්ඨන න්‍යාය වාදීන්)

1. සී. රයිට් මිලස් (C. Wright Mills)
2. ආර්. ඩැරෙන්ඩෝෆ් (R. Dahrendorf)
3. ගුන්ඩා ෆ්‍රැන්ක් (Gunder Frank)
4.

ලෙවින් කෝසර් ඝට්ඨනය

1. යථාර්ථවාදී ගැටුම් (Realistic Conflict )
2. යථාර්ථවාදී නොවන ගැටුම් (Non relation Conflict)

යථාර්ථවාදී ගැටුම් :- පුද්ගලයින්ගේ සමාජ සම්බන්ධතාවන්ගේ විශේෂිත ඉල්ලීම් ඉටු නොවීම මත ගොඩනැගෙන ඉච්ඡාභංගතාවය හේතුවෙන් ඇතිවන ගැටුම්ය.

යථාර්ථවාදී නොවන ගැටුම්:- පුද්ගලයාගේ තරගකාරීත්වය මත ඇති වන ගැටුම්ය.

සමාජ ගැටුම් මාර්ග :-

1.අන්තර් ජන්‍ය ගැටුම් - සමාජයක් ඇතුළත ඇතිවන ගැටුම්
2.බාහිර ජන්‍ය ගැටුම් - සමාජය සමග ඇති සම්බන්ධතා සහ සමාජ ක්‍රියාවලින් තුළින් ඇතිවන ගැටුම්ය. උදා :- යුද්ධ

සංඝට්ඨන න්‍යායේ දුර්වලතා

1. ගැටුමේ අඛණ්ඩ බව සහ වෙනස් වීම පිළිබඳව උවමනාවට වඩා අවධාරණය කරයි.

2. සට්ඨනයේ ඇති ප්‍රතිජානාත්මක හා නිශේධනාත්මක තත්ත්වයන් හොඳින් හඳුනාගෙන නොහැකි වීම.
3. එහි තර්ක සඳහා අනුභාවික සාක්ෂි නොමැතිකම.

සමාජ අන්තර් ක්‍රියාවාදය

සූක්ෂම සමාජ විද්‍යා සාම්ප්‍රදායට අයත් න්‍යායන් මේ නමින් හැඳින්වේ. මෙම න්‍යායන්ගේ තර්කය වන්නේ සමාජය තේරුම් ගැනීමේදී පුද්ගලයා සහ ඔහුගේ/ඇයගේ ක්‍රියාව තුළින් සමාජය ගොඩනැගීමේ ක්‍රියාවලිය දෙස බලා සමාජය තේරුම් ගත යුතු බවය.

මෙම සම්ප්‍රදායේ ප්‍රධාන න්‍යායන්
1. හුවමාරු න්‍යාය
2. සංකේතාත්මක අන්තර් ක්‍රියාවලිය

හුවමාරු න්‍යාය :-
- මේ තුළින් පුද්ගලයාගේ සමාජ චර්යාව සියුම් ලෙස අධ්‍යයන කළ හැකියි.
- විද්‍යාත්මක ශික්ෂණයක් ඔස්සේ වර්ධනය වූවක් නොවීම

හුවමාරු න්‍යාය වර්ධනය වීමේදී බ්‍රිතාන්‍යයේ පුද්ගලවාදී දිශානතිය හා ප්‍රංශයේ සාමූහිකවාදී දිශානතිය වැදගත් වේ.

මෙම සාම්ප්‍රදායන් දෙකෙහි වැදගත්වන පුදගලයන් වනුයේ
1. ආර්ථික විද්‍යාඥයින්
2. න්‍යායාත්මක මානව විද්‍යාඥයින්
3. චර්යාමය මනෝ විද්‍යාඥයින්

උදා:- ජේම්ස් ප්‍රේසර් (Frezer). මැලිනවොස්කි (Malionouski). ස්ට්‍රවුස් (Levi-struss)

මෙම න්‍යාය සමාජ විද්‍යාවට සම්බන්ධ කළ පුද්ගලයන් වනුයේ
(1) හෝමාන් Geoge C. Homans
(2) පීටර් එම්. බලව් Peter M. Blau
(3) රිචර්ඩ් එමර්සන් Richers Emerson

මේ න්‍යායට මුලින්ම වැදගත් වූයේ උපයෝගිතා වාදීන්ගේ අදහස්ය. මෙහි හුවමාරු න්‍යායවාදීන් එකගවන පොදු අදහස වනුයේ, මිනිසා සෙසු අය සමග යමක් හුවමාරු කර ගැනීමේ දී යම් ලාභයක් (භෞතික / අභෞතික) අපේක්ෂා කරන බවය. හුවමාරු න්‍යායට අවශ්‍ය මූලික පදනම් සපයන්නේ ජේම්ස්. ප්‍රේසර්ය. ඔහු ප්‍රාථමික සමාජවල ඥාතිත්වය හා විවාහය පිළිබඳ අධ්‍යයනය කළේය. උදා:- ඕස්ට්‍රේලියානු ආදි පදිංචි වාසීන් අතර ක්‍රියාත්මක නැනා මස්සිනා විවාහ සහ සමාන්තර මස්සිනාවරුන් අතර විවාහ පිළිබඳ අධ්‍යයනය.

මැලිනවොස්කිගේ අධ්‍යයනය :- ට්‍රෝබ්‍රියන් දූපත්වාසීන් පිළිබඳ සිදු කරන ලද මානව විද්‍යාත්මක අධ්‍යයන තුළින් ආර්ථික හා සමාජ හුවමාරු ක්‍රමය පිළබඳ විග්‍රහයක් කර ඇත.

උදා:- කුලා වළල්ල (Kula Ring)

ලෙවී ස්ට්‍රවුස්ගේ අදහස :- ෆ්‍රේසර්ගේ උපයෝගිතාවාදී අදහස් හා මැලිනවොස්ගේ මනෝවිද්‍යාත්මක සංකල්පවේද ප්‍රතික්ෂේප කරයි. ස්ට්‍රවුස්ට අනුව සමාජයක සිදුවන හුවමාරුව සංස්කෘතික වශයෙන් නිර්වචනය කරන ලද්දකි. ඒ අනුව එය සංකේතාත්මක හුවමාරුවකි.

හෝමාන්ස් :- වර්තමානයේ පවතින පුද්ගලවාදී හුවමාරු න්‍යාය ගොඩනැගීනමට මුල් වූ ප්‍රධාන පුද්ගලයාය. හෝමාන්ස්ගේ න්‍යාය අනුව මිනිසුන් අතර හුවමාරු පද්ධති රාශියක් තිබේ. මේ විග්‍රහයේ දී ඔහු මූලික ආර්ථික විද්‍යා හා චර්යාමය මනෝ විද්‍යා අංග උපයෝගී කර ගෙන තිබීම වැදගත් වේ. මුලින්ම සත්ත්වයින් අතර ගොඩනැගෙන චර්යා ධර්ම අධ්‍යයනය කරයි. දෙවනුව එය මානව චර්යාවන් අධ්‍යයන කිරීම උපයෝගී කරගනු ලැබිය.

හෝමාන්ස්ගේ සමාජ හුවමාරු න්‍යායට වැදගත් වූ මූලික සංකල්ප

(1) ක්‍රියාකාරීත්වය (Activity)
(2) මනෝභාවය (Sentiment)
(3) අන්තර් ක්‍රියා (Insteraction)
(4) ප්‍රමාණය (Quantity)
(5) වටිනාකම (Value)
(6) ත්‍යාග (Reward)
(7) පිරිවැය (Cost)
(8) ලාභය (Profit)

හෝමාන්ස්ගේ න්‍යායට විවේචන :-

1. සංස්ථාගත හෝ සංස්ථාගත නොවන විශේෂ නිශ්චායකයන් පිළිබඳ අවධානය යොමු නොකිරීම.
2. සංස්ථාගත පාලනයන් විග්‍රහ කිරීමට ප්‍රමාණවත් නොවීම
3. මානව චර්යාවේ සංකේතාත්මක ස්වභාවය අමතක කර තිබීම

පීටර් එම්. බ්ලූ හා හුවමාරු න්‍යාය :-

මොහු හෝමාන්ස්ට වඩා වෙනස් වන්නේ සමාජ හුවමාරුව විශ්ලේෂණය කරන ආකාරය අනුවයි.

සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදය **(Symbolic Interactonism)**

පුද්ගලයාගේ චර්යාව සංවිධානය වීමට සමාජ සාධක කෙසේ වැදගත් වන්නේ ද යන්න අධ්‍යයන කිරීමට බිහි වූ කුඩා පරිමාණ න්‍යායකි. මානව අන්තර් ක්‍රියාවට සම්බන්ධ වන එක් අයෙක් තවත් අයෙකුගේ ක්‍රියාවන් පිළිබඳ සොයා දැනගන්නා අර්ථයන්. සංකේත හා තේරුම් කර දීම් ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය මින් අධ්‍යයන කෙරේ. හර්බට්. බ්ලූමර්. හර්බට්මීට්. අර්වින් ගොෆ්මන් මෙහිදී වැදගත් වේ.

ජෝන් සිමෙල් - සමාජ ශීලීත්වය/සමාජ අන්තර් ක්‍රියාව පුද්ගලයින් අතර පවතින අත්‍යාවශ්‍ය අංශයන් ලෙස සලකනු ලැබිය.

වේබර්:- සමාජ විද්‍යාවේ මධ්‍යගත විචල්‍ය ලෙස සමාජ ක්‍රියාව සලකනු ලැබූ අතර එය සංකේතාත්මක සාධකයක් ලෙස සලකනු ලැබේ.

සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදී 20 වන සියවසේ මැද භාගයේ සිට නවතම න්‍යායාත්මක පර්යායලෝකයක් ලෙස වර්ධනය විය. මේ සඳහා දායක වූ සමාජ විද්‍යාඥයින් වනුයේ C.H. Cooley (කූලි) G.H. Mead (මීඩ්) E. Goffman (ගොෆ්මන්) සමාජ ආත්මය (Social Self) සහ ආනුභවික ආත්මය (Empirical Self) නිර්මාණය කර ගන්නා ආකාරය පෙන්වා දිය හැකිය.

මේවා සමුද්දේශ සමූහ (Reference Group) ඇසුරින් නිර්මාණය වේ. Mead (මීඩ්) මනෝ විද්‍යාත්මක එළඹුමින් පුද්ගලයාගේ චර්යාව අධ්‍යයනය කර ඇත.

## මාක්ස්, දුර්කයිම් හා වේබර්ගෙන් සමාජ විද්‍යාවට සිදු වූ සම්මාදම

කාල් මාක්ස්ගේ ප්‍රධාන අදහස් :-
ආර්ථික නියතිවාදියෙකු ලෙස සමාජය දෙස බැලීම.
ධනපතීන් හා නිර්ධනයන් ලෙස සමාජය තුළ සංවිධානය වී ඇති බව පෙන්වීම
ආර්ථිකය, දේශපාලන, නීතිය, ආගම, දර්ශනය සහ කලාව ආදි සෑම සමාජ අංගයක්ම ධනපතියාගේ උවමනාව අනුව හැඩ ගැසෙන බව කීම

කාල් මාක්ස්ගෙන් සමාජ විද්‍යාවට සිදු වූ සේවය :-

සමාජ වෙනස්වීම සිදුවන්නේ සමාජයේ නිශ්පාදන ක්‍රමයන්හි ස්වභාවය හා ඒවායේ වෙනස්වීම සමගය. ඉඩම් හිමි රදලයා හා ප්‍රවේණි දාසය ලෙස වැඩ වසම් ක්‍රමය යටතේ තිබූ පංති දෙක කර්මාන්ත හිමි ධනපතිය හා කම්කරුවා ලෙස ධනවාදී සමාජයේ දී වෙනස් වී ඇත. ලොව සෑම සමාජයකම නිශ්පාදන ක්‍රමයේ දී නිශ්පාදන සාධක හිමි හා අහිමි අය අතර ගැටුම් ඇති වේ. ඒ සමග සමාජය වෙනස් වේ. ඒ අනුව සමාජ ප්‍රගතියේ මූලික ලක්ෂණය ගැටුම වන අතර එය ප්‍රවාදය, ප්‍රතිවාදය හා සහවාදය යන සංකල්ප ඇසුරින් විස්තර කළ හැකි යැයි මාක්ස් පවසයි.

දුර්කයිම්ගෙන් සමාජ විද්‍යාවට සිදු වූ සේවය:-

සමාජ විද්‍යාව ස්වාධීන විද්‍යාවක් වශයෙන් වර්ධනයට දායක වී ඇත. සමාජ විද්‍යාවේ අරමුණ සමාජ තන්ත්‍ර විග්‍රහ කිරීම බව ඔහුගේ අදහසයි. ඔහුගේ වැදගත් ග්‍රන්ථයක් වූ Rules of Sociological Methods ය. දුර්කයිම්ට සමාජය පැවැත්මට සමාජ අනුකලනය වැදගත් ය. එය සමාජ ඒකාබද්ධතාවය ලෙස හඳුන් වනු ලැබේ.

මැක්ස් වේබර්ගේ සමාජ විද්‍යාවට සිදු වූ සේවය:-

සමාජය හැදෑරීමේ වැදගත් වනුයේ සමාජ ක්‍රියා බව මොහු පෙන්වා දේ. සමාජ ක්‍රියා තේරුම් ගැනීමට කළ යුතු වන්නේ ඒවා කුමන හේතුවක් මත කළා දැයි ඒ අය විසින්ම දෙන අර්ථකථනය අනුවයි. සමාජ සම්ප්‍රදායික තත්ත්වයක සිට නවීන කාර්මික සමාජ දක්වා පරිවර්තනය වන බව ඔහු පෙන්වා දෙයි. ඔහුට අනුව ආගම හා ආධිපත්‍යය සංකල්පය ද සමාජ විද්‍යාවේ දී වැදගත් වේ.